# මල්වලට පාට ලැබුණු හැටි



ඉසලි අභිමානි කුමාරි මාන්නප්පෙරුම

# මල්වලට පාට ලැබුණු හැටි

ඉසලි අභිමානි කුමාරි මාන්නප්පෙරුම

කර්තෘ ප්‍රකාශනයකි

කෘතිය පළ කරන දිනය : 2025.02.08

# පිදුම

මගේ ආදරණීය දෙමාපියන්ට සහ ගුරුමැණිවරුටත් පියවරුන්ටත් මෙම පොත් පිංචය සෙනෙහසින් යුතුව පිළිගන්වමි.

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය හා ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහනයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රත්ඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය- මහනුවර

පුංචි යාලුවනේ ඔයාලා දන්නවද ඉස්සර මල්වලට ලස්සන ලස්සන  පාට තිබුනේ නෑ. හැම මලකටම තිබුණේ දැන්වගේ ලස්සන නැති අඳුරු පාටවල්.



ඔන්න ඔහොම කාලය ගෙවීගන යද්දී මල්වල පැණි බොන්න සමනල්ලු රෑනක් හැමදාම එන්න පටන්ගත්තා. ඒ සමනල්ලු නම් හරිම ලස්සනයි. පාට පාට සමනල්ලු මල්වල පැණි උරමින් මල් අතර එහා මෙහා පියාඹමින් සෙල්ලම් කළා.



මේ මල්යායේ හිටියා හරිම නුවණක්කාර මලක්. එයා තමා මල් වල රැජිණ. මල්වලට තිබෙන හැම ප්‍රශ්නයක්ම එයා තමා විසඳලා දුන්නේ. එයා දින ගණනාවක් කල්පනා කරා..... එයාට හිතුනා සමනල්ලු පාට පාටින් ලස්සන වෙන්නත් අපි එහෙම ලස්සන පාට නොවෙන්නත් හේතුව මොකක්ද කියලා. ඒ මල අනික මල්වලට කතා කරලා මෙහෙම කිව්වා.

"යාළුවනේ....යාළුවනේ අර අපේ මල්පැණි බීලා සෙල්ලම් කරන්න එන සමනල්ලු හරිම ලස්සනයි. එයාලා කොහොමද එහෙම ලස්සන වුනේ""? අපිත් ඒ වගේ පාට පාටින් හිටියනම් කොච්චර ලස්සනද?



**"යාලුවනේ ඔයාලත් කැමතිද සමනල්ලු වගේ පාට පාට වෙන්න"?**

**"ඔව් ඔව් අපි හැමෝම කැමතියි.. "ඔක්කොම මල් කෑ ගහලා කිව්වා.එතකොට තව මලක් මෙහෙම කීවා.**

**" එහෙනම් යාළුවනේ අදි හෙට සමනල්ලු ආවාම එයාලගෙන් අහලා බලමු එයාලට ලස්සන පාට ලැබුනේ කොහොමද**



කියලා"

පසුවදා සමනල්ලු එනකම් මල් නොඉවසිල්ලෙන් බලා සිටියා.

එදත් වෙනදා වගේම සමනල්ලු රංචුවක්ම මල් පැණිබීලා සෙල්ලම් කරන්න ආවා. එතකොට මල් සේරම කෑ ගහලා මෙහෙම ඇහුවා.

"සමනල් යාළුවනේ...... අපිටත් කියන්නකෝ ඔයාලට මේ



තරම් ලස්සන පාට ලැබුනේ කොහොමද කියලා....

සමනල්ලු මල්වලට මෙහෙම කිව්වා..” යාලුවනේ අපිට මේ පාට ලැබුනේ දේදුන්නෙන්.

අර බලන්නකෝ අර දේදුන්න දිහා. අපි දේදුන්නෙන් තමා මේ පාට ගෙනාවේ” කියලා කිව්වා.

අනේ අපටත් දේදුන්නෙන් පාට ගෙනත් දෙනත් දෙන්නකෝ.



මල් බොහොම දුකින් කීවා.

මල් හැමදාම සමනලුන්ට පැණි දෙන නිසා සමනලයොත් මලුත් හරිම යාලුයි. ඒ නිසා මල්වලට පාට ගෙනත් දෙන්න සමනලයෝ කැමති උනා. සමනල්ලු වේගයෙන් දේදුන්නට පියඹලා ගියා.





ඊලග දවසේ දේදුන්නෙන් ගොඩාක් පාට අරන් සමනල්ලු මල් වෙතට ආවා. ඇවිත් දේදුන්නෙන් ගෙනාව පාට හැම මලකම ගෑවා. එදා ඉඳලා හැම මලක්ම වගේ ලස්සන උනා. හැම මලකටම එක එක පාට ලැබුණා.

එදා ඉඳලා හැම මලක්ම වගේ ලස්සන උනා. හැම මලකටම එක එක පාට ලැබුණා.



එදා ඉඳලා මල් සහ සමනල්ලු හරිම යාලුයි. මල් හැමදාම සමනලුන්ට මල් පැණි දුන්නා.



ඉතිං පුංචි යාළුවනේ අපිත් මල් සහ සමනල්ලු වගේ පුංචි අපිත් එකිනෙකාට උදවු උපකාර කර ගැනීම හරිම වැදගත්. එතකොට අපි හැමෝටම, හැමදාම සතුටින් ඉන්න පුළුවන්

සමාප්තයි.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයන් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප් නැංවීම හා එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමකි. පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාවය වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබා දිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක් වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්

ISBN 978-624-208-338-4